# <u>කොරෝනා</u>

බල ලෝභයෙන් එකිනෙක පරයා නැගෙන
ලොවටම ලන්සු තියමින් කේවල් කරන
බල තරගයට පණ පොවමින් ගොඩනැගුණ
රටවල් නගර පණ අයදියි එක පෙළට

රස බොජුනට අම රස එක්වන ලෙසට
තලුමර මරා ගිලදැල්වූ සාපයට
පන ගැහෙනා සතුන්ට දුන් දුක්වලට
ජිවිත යදියි කලකම් පලදුන් ලෙසට

හුස්ම ගන්න මොහොතක්වත් නොමැති කල
අහින්සකයෝ දුක් විදිනා අයුරු දැක
සොබාදහම් මාතාවට පහල වුණ
සිතුවිල්ලකට මේ ලෙස ඉඩ ලැබි ඇත

මේ ලෝතලයේ සැබෑ ලෙසම හිමිකරුවන්
සොබාදහම් මාතාවට එකඟවුවත්
තිරිසන් ලෙසින් හංවඩු ගැසු නමුදු ඔවුන්
සැබෑවටම තිරිසන් මේ අමන දනන්....

ලියනආරච්චි P.A.B.I

HS/2017/16521